කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 සැප්තැම්බර්

මානවශාස්ත්‍ර පීඨය

**ක්‍රිස්තියානි සංස්කෘතිය** (පැරණිතම නිර්දේශය)

(අධ්‍යයන වර්ෂ 2007 සිට 2011 දක්වා)

**ක්‍රිස්තියානි ධර්මයේ වර්ධනය CHCU– E3025**

කැමති ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ආගම සහ දරිද්‍රතාවය අතර තිබෙන සම්බන්ධතාවය පැහැදිලි කරමින් ආගම දරිද්‍රයන් නඟා සිටුවීම ද, ආගම දරිද්‍රයන් තවත් පීඩාවට ඇද දමන ආකාරය ද නිදසුන් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

02. ඓහික ආගම් (Cosmic Religions) හා ලෝකෝත්තර ආගම් (Meta-Cosmic Religions) යනු මොනවාදැයි පැහැදිලි කර සෑම ආගමකම මූලික හරය වන ශුද්ධත්වය ඇදහිලිවන්තයෙකු විසින් කෙසේ අත්දැකිය හැකිද යන්න විග්‍රහයක යෙදෙන්න.

03. සමය දර්ශනය (Philosophy of Religion) පශ්චාත් නූතන යුගයට කෙසේ බලපායිද යන්න සඳහන් කර එය ලෞකිකකරණය හමුවේ අභියෝගයට ලක්වන ආකාරය සාකච්ඡා කරන්න.

04. විවිධ ආගමික අත්දැකීම් මිනිස් මනස සමඟ ක්‍රියාකාරී වන ආකාරය විධි ආගම් පාදක කර ගනිමින් විමර්ශනය කරන්න.

05. ආගමික වත් පිළිවෙත්, ආධ්‍යාත්මිකත්වය හා ජීවිත පරිවර්තනය යන සංකල්ප අතර සම්බන්ධතාවය පැහැදිලි කරමින් ඇදහිලිවන්තයෙකු ජීවිත වෙනසක් කරා යොමු වන ආකාරය විමසන්න.

06. මාටින් ලූතර්ගේ දේව ධර්මයේ මූලික ලක්ෂණ ඔහුගේ කෘති ඇසුරින් සාකච්ඡා කරන්න.

07. "හිප්පෝ හි අගොස්තීනුගේ ක්‍රිස්තියානි චින්තනය තේරුම් ගැනීමට තත්කාලීන සමාජයේ පැවති ඩොනටියානුවාදය සහ පෙලගියානුවාදය යන වේදභේද උපකාරී වේ." මෙම අදහස සාකච්ඡා කරන්න.

08. තෝමස් ඇක්වයිනස් විසින් රචිත ප්‍රධාන කෘතිවල අඩංගු මූලික සංකල්ප පිළිබඳ විග්‍රහයක යෙදෙන්න.

09. ඇලෙක්සැන්ඩ්‍රියාවේ ක්ලෙමන්ට් සහ ඔරිගන්ගේ චින්තනයන් පිළිබඳව සංසන්දනාත්මක අධ්‍යයනයක් කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් (02) පිළිබඳව සවිස්තරාත්මක සටහන් ලියන්න.

    i. ජෝන් හෙන්රි නිව්මන්
    ii. ක්ලෙයෝවා හි බර්නාඩ්
    iii. ලියෝන්ස් හි අයිරේනියස්
    iv. කාන්තාව හා ක්‍රිස්තියානි දැක්ම
    v. සාමය පිළිබඳ ක්‍රිස්තියානි චින්තනය

*********************************